# පත්තිරුව



# 2024
# කාර්ය සාධන වාර්තාව

## දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව



## දැක්ම

ප්‍රශස්ත භූමි උපයෝජනය තුළින් දිවයිනේ විශිෂ්ඨතම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව බවට පත්වීම.



## මෙහෙවර

තිරසාර සංවර්ධනය උදෙසා නීත්‍යානුකූලව රජයේ ඉඩම් ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම, නිරවුල් කිරීම, බැහැර කිරීම හා ආදායම් රැස් කිරීම තුළින් දකුණේ ජනතාවගේ ජීවන තත්ත්වය හා ආර්ථිකය නංවාලීම සඳහා ජනතා කේන්ද්‍රීය සේවා සම්පාදනයෙන් දායක වීම.

## පළාත් ඉඩම් කොමසාරිස්තුමාගේ පණිවිඩය



2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ඉඩම් පිළිබඳ ඓතිහාසික තොරතුරු යාවත්කාලීන කරමින් 2023.12.31 දිනට දකුණු පළාතේ ඉඩම් පිළිබඳ වඩාත් නිවැරදි තොරතුරු පද්ධතියක් සකස් කර ගැනීමට අපට හැකිවිය. එම තොරතුරු 2024.12.31 දිනට නැවත වරක් යාවත්කාලීන කිරීම සඳහා විශේෂයෙන්ම මෙම ''පත්තිරුව'' කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කරන අතර ඒ අනුව විවිධ රජයේ ඉඩම් ලේඛණ මඟින් දකුණු පළාත තුළ බැහැර කර ඇති රජයේ ඉඩම් සංඛ්‍යාව ඉඩම් කැබලි 302,532 කි.

එසේම 2024 වර්ෂයේ ආරම්භ කරන ලද උරුමය නිදහස් දීමනාපත්‍ර ලබාදීමේ 'උරුමය' වැඩසටහන ඔස්සේ බැහැර කරන ලද රජයේ ඉඩම් ප්‍රමාණය පිළිබඳ නව තොරතුරු මෙම වාර්තාව තුළ ඇතුළත් කර ඇත. විශේෂයෙන් රජයට භාර ගත් බලපත්‍ර හා දීමනාපත්‍ර විශාල සංඛ්‍යාවකින් දකුණු පළාතට උරුමය දීමනාපත්‍ර 1777 ලබා දෙන ලදී. වසර 45 ක් තිස්සේ ජනාධිපතිවරුන් 8 දෙනෙකු යටතේ ලබාදෙන ලද දීමනාපත්‍ර ''උරුමය'' දීමනාපත්‍ර බවට පත්කිරීම වසරකින් දෙකකින් කළ හැකි කාර්යයක් නොවන බව වැඩසටහන ආරම්භයේදීම අප විසින් හඳුනා ගෙන තිබුණි. මේ වන විට එම දීමනාපත්‍ර වැඩසටහන වත්මන් නව රජය විසින් වඩාත් ප්‍රගතිශීලි අයුරින් ඉටු කිරීමේ අරමුණින් තාවකාලිකව නතර කර ඇති අතර එම කටයුතු නව උපදෙස් ලද වහාම 2025 වර්ෂයේදී ආරම්භ කිරීමට හැකි වනු ඇත.

දකුණු පළාතේ රජයේ ඉඩම්වලින් ලැබෙන සියලු ආදායම් ඇතුළත් තොරතුරු පද්ධතියක් ගොඩ නැගීමටත් සියලු බදුකරුවන් නියමිත දින වලට බදු ගෙවීම සඳහා ස්වයංක්‍රීය කෙටි පණිවිඩ සේවාවක් හරහා දැනුවත් කිරීමටත් ආරම්භ කරන ලද IRIS ව්‍යාපෘතිය (රජයේ ඉඩම් අන්තර් ක්‍රියාකාරී ආදායම් තොරතුරු පද්ධතිය) මෙන්ම රජයේ ඉඩම් දකුණු පළාත තුළ භූගෝලීය වශයෙන් විසිරී ඇති ආකාරය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පරිගණක ආශ්‍රිත සිතියම් සකස් කිරීම සඳහා ආරම්භ කරන ලද GISSL ව්‍යාපෘතිය (Geographical Information System for State Land) - රජයේ ඉඩම් පිළිබඳ භූගෝලීය තොරතුරු පද්ධතිය) 2024 වසරේ අප දෙපාර්තමේන්තුව විසින් අලුතින් සංවර්ධනය කරන ලද නව ව්‍යාපෘති ලෙස මෙහිදී හඳුන්වාදීමට ලැබීම පිළිබඳ සතුටු වෙමි. විශේෂයෙන්ම නව තාක්ෂණය යොදා ගනිමින් ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය නිර්මාණය කිරීම වෙනුවෙන් සහකාර ඉඩම් කොමසාරිස් පසන් රාහුල මධුසංඛ මහතා සහ ඉඩම් නිලධාරී චමින්ද කිත්සිරි මහතාත් දක්වන ලද දායකත්වය මෙහිදී විශේෂයෙන්ම සිහිපත් කරමි.

ඒ සමගින් දකුණු පළාත තුළ 2024 වර්ෂය පුරා දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන ලද විවිධ වැඩසටහන් පිළිබඳ සංක්ෂිප්ත අදහසක් පත්තිරුව කාර්ය සාධන වාර්තාව තුළින් ලබා ගැනීමට හැකි වනු ඇත. එසේම පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු මාණ්ඩලික නිලධාරීන් ඉඩම් නිලධාරීන්, ජනපද නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් ඇතුළු ඉඩම් රාජකාරී සම්බන්ධිත නිලධාරීන් පුහුණු කිරීම අප දෙපාර්තමේන්තුවේ තවත් වැදගත් කාර්යභාරයක් වන අතර ඒ සඳහා ද 2024 වර්ෂයේ යම් දායකත්වයක් දැක්වීමට හැකිවීම පිළිබඳ සතුටු වෙමි.

දෙපාර්තමේන්තු වලට රජයේ ඉඩම් පැවරීම් සහ පළාත් පාලන ආයතන සඳහා රජයේ ඉඩම් බැහැර කිරීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන අතර මෙහිදී රජයේ ආයතන සහ පළාත් පාලන ආයතන භුක්ති විඳින ඉඩම්වල නිරවුල් අයිතිය එම ආයතන වෙත සතුකරදීමේ වගකීම ඉතා ප්‍රශස්ත ආකාරයෙන් ඉටු කිරීමට අප දෙපාර්තමේන්තුවට හැකි වී ඇත. ඒ ඔස්සේ 2024 වර්ෂයේදී පොලිස් දෙපාර්තමේන්තුව භුක්ති විඳින ලද ඉඩම් අතුරින් ඉඩම් 49 ක අයිතිය එම දෙපාර්තමේන්තුවට ලබාදීමට අපට හැකිවිය.

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මුහුණදෙන විශාලතම අභියෝගය වන්නේ දකුණු පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 50 මගින් සකස් කර කොළඹ පිහිටි ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති විවිධ දීර්ඝකාලීන බදු නිර්දේශ විශාල ප්‍රමාණයක් නිසි පරිදි අනුමත නොවීමයි. මේ හේතුවෙන් වසරකට දකුණු පළාත් සභාවට අහිමි වන මුදල රුපියල් මිලියන ගණනකි. මේ පිළිබඳ දීර්ඝකාලයක් තිස්සේ බලධාරීන්ගේ අවධානය යොමු කරනු ලැබුව ද මෙතෙක් එම ගැටළුවට නිශ්චිත විසඳුමක් නොලැබීම කණගාටුදායක කරුණකි. ඒ පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු පවසන්නේ නම් 2024.12.31 දින දක්වා සකස් කරන ලද අනුමත නොවූ දීර්ඝකාලීන බදු නිර්දේශ සංඛ්‍යාව 826 කි. මෙම ගැටළුව ඉක්මනින් විසඳා ගත හොත් දකුණු පළාතේ ආදායම විශාල ප්‍රතිශතයකින් ඉහළ නංවා ගැනීමට ඇති හැකියාව අප දෙපාර්තමේන්තුවට පවතී.

අවසාන වශයෙන් රජය ආරක්ෂා කරන ආකාරයේ ප්‍රශස්ත ඉඩම් කළමනාකරණයක් ඉටු කිරීම දකුණු පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්, අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) ඇතුළු ඉඩම් කළමනාකරණයට සම්බන්ධ අනෙකුත් ආයතන හා නිලධාරීන් සමඟ මනා සම්බන්ධීකරණයකින් සහ සහයෝගීතාවයක් පවත්වාගෙන යමින් දකුණු පළාත තුළ රජයේ ඉඩම් ප්‍රශස්ථ ලෙස කළමනාකරණය කරමින් මහජනතාවට ඉඩම් අයිතිය ලබාදීමෙන් රජයට අයවිය යුතු බදු මුදල් නිරවුල්ව අයකර ගැනීමේත් වගකීම ඉදිරි වර්ෂ සඳහා ද ඉටු කිරීමේ අධිෂ්ඨානයෙන් දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව කැප වන බව සඳහන් කරමි.

**සේනක පල්ලියගුරුගේ**
**පළාත් ඉඩම් කොමසාරිස්- දකුණු පළාත**

# සංවිධාන ව්‍යුහය



ඉඩම් කොමසාරිස් (1)
නියෝජ්‍ය / සහකාර ඉඩම් කොමසාරිස් ගාල්ල අංශය (1)
නියෝජ්‍ය / සහකාර ඉඩම් කොමසාරිස් මාතර අංශය (1)
නියෝජ්‍ය / සහකාර ඉඩම් කොමසාරිස් කලාප හා හම්බන්තොට අංශය (1)
ගණකාධිකාරී (1)
නියෝජ්‍ය / සහකාර ඉඩම් කොමසාරිස්වරුන් ගාල්ල, මාතර හා හම්බන්තොට සහකාර ඉඩම් කොමසාරිස් කර්යාලය (3)
රජයේ මිනින්දෝරු (1)
ජ්‍යෙෂ්ඨ ජනපද නිලධාරී (1)
පරිපාලන නිලධාරී (1)
ජ්‍යෙෂ්ඨ ජනපද නිලධාරී (6)
ප්‍රධාන කළමනාකරන සේවා නිලධාරී (1)
ප්‍රධාන කළමනාකරන සේවා නිලධාරී (3)
සැලසුම් අංශය
ගාල්ල අංශය
මාතර අංශය
හම්බන්තොට අංශය
පාලන අංශය
ගිණුම් අංශය
අංශ ප්‍රධානී
මුදල් සහකාර
සංවර්ධන නිලධාරී (4)
සංවර්ධන නිලධාරී (5)
සංවර්ධන නිලධාරී (5)
සංවර්ධන නිලධාරී (3)
සංවර්ධන නිලධාරී (3) කළ. සේවා නිලධාරී (4)
සංවර්ධන නිලධාරී (7) කළ. සේවා නිලධාරී (2)
සංවර්ධන නිලධාරී (22) කළ. සේවා නිලධාරී (5)
ප්‍රා.ලේ. කාර්යාලවල සංවර්ධන නිලධාරී (76) ජනපද නිලධාරී (46)
කා.කා.ස.
කා.කා.ස.
කා.කා.ස.
කා.කා.ස. (1)
රියදුරු (2) කා.කා.ස. (1)
කා.කා.ස. (1)
රියදුරු (3) කා.කා.ස. (3)
මැනුම් සහයක (8)

# දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

රජයේ ඉඩම් පරිපාලනය හා කළමනාකරණය සිදු කරනු ලබන දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ප්‍රධාන පනත් පහක් සම්බන්ධයෙන් රාජකාරී ඉටු කරනු ලබයි.

1. 1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥා පනත
2. 1947 අංක 08 දරණ රජයේ ඉඩම් ආඥා පනත
3. 1979 අංක 43 දරණ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත
4. 1979 අංක 07 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත
5. 1950 අංක 09 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත

මෙම පනත් උපයෝගී කර ගනිමින් රජයේ ඉඩම් සම්බන්ධයෙන් මහජනතාව වෙත සපයනු ලබන සේවාවන් පහත ප්‍රධාන සංරචකයන් ඔස්සේ සිදු කරනු ලබයි.

1. රජයේ ඉඩම් අයිතිය බැහැර කිරීම.
2. ඉඩම් ආදායම් එකතු කිරීම හා ප්‍රවර්ධනය
3. ඉඩම් මැන සැලසුම් කිරීම.
4. රජයේ ඉඩම් සංවර්ධනය හා ආරක්ෂා කිරීම.
5. රජයේ ඉඩම් නිරවුල් කිරීම.
6. ඉඩම් රාජකාරී සම්බන්ධ උපදේශනය හා ධාරිතා සංවර්ධනය

උක්ත ප්‍රධාන සංරචක ඔස්සේ වාර්ෂික ඉලක්ක පිහිටුවමින් අප විසින් ඉටු කරනු ලබන ප්‍රධාන රාජකාරී පහත පරිදි වේ.

01. රජයේ ඉඩම් අයිතිය බැහැර කිරීම සඳහා අප ඉටු කරනු ලබන රාජකාරී :-

   1. ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (2) වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම.
   2. බලපත්‍ර ඉඩම් සඳහා ඉ.සං.ආ පනතේ 19 (4) වගන්තිය යටතේ දිමනාපත්‍ර හෝ රජයේ ඉ.ආ පනත යටතේ  නිදහස් දීමනාපත්‍ර සැකසීමට නිර්දේශ ලබා දීම.
   3. නේවාසික පදනමින් ලබා දී ඇති දීර්ඝකාලීන බදු ඉඩම් සඳහා නිදහස් දීමනාපත්‍ර සැකසීමට නිර්දේශ ලබා දීම.
   4. ආපදාවන්ට ලක් වූ ජනතාව සඳහා නිදහස් දීමනාපත්‍ර ලබා දීමට නිර්දේශ ලබා දීම.
   5. රජයේ දෙපාර්තමේන්තු භුක්ති විඳින ඉඩම් පවරා දීමට නිර්දේශ ලබා දීම.
   6. පළාත් පාලන ආයතන භුක්ති විඳින ඉඩම් පවරා දීමට නිර්දේශ ලබා දීම.
   7. ආගමික සිද්ධස්ථාන වෙත පූජාභූමි ඔප්පු සැකසීමට හෝ නිදහස් දිමනා පත්‍ර නිර්දේශ ලබා දීම.

02. ඉඩම් ආදායම් එකතු කිරීම සහ ප්‍රවර්ධනය වෙනුවෙන් අප ඉටු කරන ප්‍රධාන රාජකාරී

1. පහත වාර්ෂික අවසරපත්‍රවලට අදාළ බදු මුදල් එකතු කිරීම හා නව අවසරපත්‍ර නිකුත් කිරීම.
   - අ. පදිංචිය සඳහා L.C - 75 වාර්ෂික බලපත්‍ර
   - ආ. එළදාව භුක්ති විඳීම සඳහා L.C - 78 වාර්ෂික බලපත්‍ර
   - ඇ. ජලය හරවා ගැනීම සඳහා L.C - 71 වාර්ෂික බලපත්‍ර
   - ඈ. රජයේ ගොඩනැගිලි සඳහා L.C - 77 වාර්ෂික බලපත්‍ර

2. පහත පදනම් යටතේ ලබා දී ඇති දීර්ඝකාලීන බදු ඉඩම්වලට අදාළ බදු මුදල් එකතු කිරීම හා නව දීර්ඝකාලීන බදු අනුමැතීන් ලබා ගැනීමට නිර්දේශ ලබා දීම.
   - අ. වාණිජ කටයුතු සඳහා නිකුත් කරන දීර්ඝ කාලීන බදු
   - ආ. නේවාසික කටයුතු සඳහා නිකුත් කරන දීර්ඝ කාලීන බදු
   - ඇ. කෘෂිකාර්මික කටයුතු සඳහා නිකුත් කරන දීර්ඝ කාලීන බදු

3. ගැණුම් මිල අයකර ලබාදෙන බලපත්‍ර මඟින් අය කළ යුතු තක්සේරු මුදල් අය කිරීම.
4. මධ්‍යම පානිත්ක ඉඩම් පැවරීමේ දී හා මධ්‍යම පාන්තික ක්‍රමයෙන් බැහැර කිරීමේ දී තක්සේරු වටිනාකම අය කිරීම.
5. රාජ්‍ය ආයතන භුක්ති විඳින ඉඩම්වල එළදාව භුක්ති විඳීම වෙනුවෙන් එළදා බදු එකතු කිරීම.
6. රජයේ ඉඩම්වල එළදාව වෙන්දේසි කර ආදායම් එකතු කිරීම.
7. රජයේ ඉඩම්වලින් එකතු කළ යුතු වෙනත් ආදායම් එකතු කිරීම.

මෙම ආදායම් පළාත් සභාවේ පහත ආදායම් ශීර්ෂ වෙත බැර කරනු ලබයි.

අ. රජයේ ඉඩම් ආඥා පනත යටතේ අය කරනු ලබන වාර්ෂික බදු මුදල්, දීර්ඝ කාලීන බදු මුදල්, එළදා බදු මුදල්, වෙන්දේසි බදු හා වෙනත් ආදායම් 2002-01-03 ආදායම් ශීර්ෂයට බැර කරනු ලබයි.

ආ. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අය කරනු ලබන ගැණුම් මිල හා මධ්‍යම පාන්තික ඉඩම්වලට අදාළව අය කරනු ලබන තක්සේරු මුදල් 2002-01-05 ආදායම් ශීර්ෂයට බැර කරනු ලබයි.

උක්ත රාජකාරීවලට අමතරව ඉඩම් බෙදාදීම් වෙනුවෙන් ද, ඉඩම් ගැටලු විසඳීම සඳහා ද, රජයේ ඉඩම් ආරක්‍ෂා කිරීම වෙනුවෙන් ද ඉඩම් මැන අනුරේඛන සැකසීම මෙම දෙපාර්තමේන්තුවෙන් ඉටු කරනු ලබන ප්‍රධාන රාජකාරියකි.

**2024 සකස් කළ බලපත්‍ර සංඛ්‍යාව 3515**
















ඉ.සං.ආ. පනතේ 19(2) වගන්තිය යටතේ නොමිලේ සහ ගැනුම් මිල කාණ්ඩ දෙක යටතේ පසුගිය වසර හතරක කාලය තුළ දකුණු පළාත් ඉඩම් කොමසාරිස් විසින් ඉඩම් කච්චේරි අවසන් අනුමැතිය ලබාදුන් ස්ථිර බලපත්‍ර සංඛ්‍යාව මින් නිරූපිතයි.

| | ගාල්ල | | | මාතර | | | හම්බන්තොට | | | දකුණු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| 2021 | 6409 | 2766 | 43% | 2881 | 1543 | 54% | 4779 | 748 | 16% | 14069 | 5057 | 36% |
| 2022 | 3317 | 3267 | 98% | 1744 | 1046 | 60% | 2648 | 1084 | 41% | 7709 | 5397 | 70% |
| 2023 | 2914 | 3466 | 119% | 1321 | 1497 | 113% | 1625 | 1413 | 87% | 5860 | 6376 | 109% |
| 2024 | 1843 | 1818 | 99% | 919 | 1005 | 109% | 1176 | 692 | 59% | 3938 | 3515 | 89% |

**2024 නිර්දේශ කළ දීමනාපත්‍ර සංඛ්‍යාව**
**5282**
















2021, 2022, 2023 වර්ෂ වලදී ඉ.සං.ආ.ප. 19(4) වගන්තිය යටතේ හා 2024 වර්ෂයේදී ර.ඉ.ආ. පනතේ 6 වන වගන්තිය යටතේ දීමනාපත්‍ර හා නිදහස් දීමනාපත්‍ර සකස් කිරීමට ඉ.කො.ජ. වෙත යොමු කරන ලද නිර්දේශ සංඛ්‍යාව මින් නිරූපිතයි.

| | ගාල්ල | | |
|---|---|---|---|
| වර්ෂය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| **2021** | 1252 | 552 | 44% |
| **2022** | 1645 | 746 | 45% |
| **2023** | 946 | 803 | 85% |
| **2024** | 5541 | 3253 | 59% |

| මාතර | | |
|---|---|---|
| ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| 668 | 295 | 44% |
| 939 | 284 | 30% |
| 457 | 457 | 100% |
| 949 | 1376 | 144% |

| හම්බන්තොට | | |
|---|---|---|
| ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| 1011 | 829 | 82% |
| 1259 | 523 | 42% |
| 1107 | 1080 | 98% |
| 310 | 653 | 210% |

| දකුණු පළාත | | |
|---|---|---|
| ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| 2931 | 1676 | 57% |
| 3843 | 1553 | 40% |
| 2510 | 2340 | 93% |
| 6800 | 5282 | 77% |

## 2024 දීර්ඝකාලීන බදු නිර්දේශ ඉදිරිපත් කළ සංඛ්‍යාව 257
















රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික/කෘෂිකාර්මික/වාණිජ/සමිති කටයුතු පදනමින් දීර්ඝකාලීන බදුකර සකස් කිරීම සඳහා අනුමැතිය පිණිස පසුගිය වසර හතරක කාලය තුළ ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කරන ලද නිර්දේශ වාර්තා සංඛ්‍යාව මින් නිරූපිතයි.

| | ගාල්ල | | | මාතර | | | හම්බන්තොට | | | දකුණු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| **2021** | 94 | 125 | 133% | 114 | 31 | 27% | 222 | 141 | 64% | 430 | 297 | 69% |
| **2022** | 119 | 61 | 51% | 114 | 42 | 37% | 165 | 25 | 15% | 398 | 128 | 32% |
| **2023** | 273 | 168 | 62% | 117 | 90 | 77% | 127 | 123 | 97% | 517 | 381 | 74% |
| **2024** | 190 | 138 | 73% | 85 | 53 | 62% | 110 | 66 | 60% | 385 | 257 | 67% |

## 2024 වාර්ෂික බදුකර LC 75 සහ LC 78 සකස් කළ සංඛ්‍යාව 969
















රජයේ ඉඩම් ආඥා පනත යටතේ රක්ෂිත ඉඩම් කොටස් පරිහරණය කරන අනවසර පුද්ගලයන් වෙනුවෙන් පසුගිය වසර හතරක කාලය තුළ පදිංචිය/ව්‍යාපාර සඳහා හා වගා කරන ලද ඉඩම් වලින් ඵලදාව ලබා ගැනීම සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමට ලබා දුන් අනුමැතීන් සංඛ්‍යාව මින් නිරූපිතයි.

| | ගාල්ල | | | මාතර | | | හම්බන්තොට | | | දකුණු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| **2021** | 176 | 212 | 120% | 336 | 316 | 94% | 50 | 17 | 34% | 562 | 545 | 97% |
| **2022** | 264 | 133 | 50% | 340 | 300 | 88% | 150 | 12 | 8% | 754 | 445 | 59% |
| **2023** | 248 | 601 | 242% | 418 | 428 | 102% | 98 | 106 | 108% | 764 | 1135 | 149% |
| **2024** | 628 | 575 | 92% | 344 | 350 | 102% | 47 | 44 | 94% | 1019 | 969 | 95% |

## 2024 වාර්ෂික බදුකර LC 75
## 468
















පසුගිය වසර හතරක කාලය තුළ රජයේ රක්ෂිත ඉඩම්වල ගොඩනැගිලි ඉදිකර (නේවාසික හා ව්‍යාපාර සඳහා) භුක්ති විඳිනු ලබන අය සඳහා පසුගිය වසර හතරක කාලය තුල ලබා දෙන ලද වාර්ෂික බලපත්‍ර

| | ගාල්ල | | | මාතර | | | හම්බන්තොට | | | දකුණු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| **2021** | 66 | 88 | 133% | 116 | 132 | 114% | 30 | 3 | 10% | 212 | 223 | 105% |
| **2022** | 85 | 31 | 36% | 131 | 101 | 77% | 50 | 0 | 0% | 266 | 132 | 50% |
| **2023** | 81 | 208 | 257% | 137 | 163 | 119% | 31 | 63 | 203% | 249 | 434 | 174% |
| **2024** | 270 | 309 | 114% | 144 | 146 | 101% | 6 | 13 | 217% | 420 | 468 | 111% |

## 2024 වාර්ෂික බදුකර LC 78
## 588



















| | ගාල්ල | | | මාතර | | | හම්බන්තොට | | | දකුණු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| **2021** | 110 | 124 | 113% | 220 | 184 | 84% | 20 | 14 | 70% | 350 | 322 | 92% |
| **2022** | 179 | 102 | 57% | 209 | 199 | 95% | 100 | 12 | 12% | 488 | 313 | 64% |
| **2023** | 167 | 393 | 235% | 281 | 265 | 94% | 67 | 43 | 64% | 515 | 701 | 136% |
| **2024** | 358 | 266 | 74% | 200 | 204 | 102% | 41 | 20 | 49% | 599 | 490 | 82% |

## 2024 රජයේ ඉඩම් බදු ආදායම දකුණු පළාත රු.මි. 205

| | දකුණු පළාත | | |
|---|---|---|---|
| වර්ෂය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
| **2021** | 152,202,057.00 | 141,462,336.00 | 93% |
| **2022** | 195,581,865.23 | 203,026,957.05 | 104% |
| **2023** | 187,062,975.81 | 195,725,438.80 | 105% |
| **2024** | 194,461,005.67 | 205,633,020.14 | 105% |

පසුගිය වසර හතරක කාලය තුළ රජයේ ඉඩම්වලින් එකතු කරන ලද සමස්ත බදු ආදායම් ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක වශයෙන් සංසන්දනාත්මකව ඉහත ප්‍රස්ථාර වල නිරූපණය කර ඇත.













| | ගාල්ල | | | මාතර | | | හම්බන්තොට | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | ඉලක්කය (රු.) | ප්‍රගතිය (රු.) | ප්‍රතිශතය | ඉලක්කය (රු.) | ප්‍රගතිය (රු.) | ප්‍රතිශතය | ඉලක්කය (රු.) | ප්‍රගතිය (රු.) | ප්‍රතිශතය |
| **2021** | 33,894,372.41 | 65,502,195.66 | 193% | 22,841,547.29 | 27,716,372.46 | 121% | 95,690,353.00 | 48,243,767.88 | 50% |
| **2022** | 103,722,380.39 | 114,501,894.22 | 110% | 29,886,603.04 | 35,763,412.68 | 120% | 61,972,881.80 | 52,761,650.15 | 85% |
| **2023** | 75,144,217.94 | 94,422,889.51 | 126% | 34,543,602.87 | 41,758,431.40 | 121% | 77,375,155.00 | 59,544,117.89 | 77% |
| **2024** | 98,447,253.64 | 99,767,965.11 | 101% | 41,409,181.45 | 46,457,962.92 | 112% | 54,604,570.58 | 59,407,092.11 | 109% |

**2024 වාර්ෂික බදු ආදායම**
**දකුණු පළාත**
**රු.මි. 27.8**

**2024 එළදා බදු ආදායම**
**දකුණු පළාත**
**රු.මි. 2.5**

**2024 දීර්ඝකාලීන බදු ආදායම**
**දකුණු පළාත**
**රු.මි. 62.9**

රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාර්ෂික බදු, එළදා බදු, දීර්ඝකාලීන බදු අයකරනු ලබන අතර ඒවා ආදායම් ශීර්ෂ 2002-01-03 යටතේ ගිණුම් ගත කරනු ලැබේ. එම බදු රැස් කිරීම පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාර වල නිරූපිත වේ.










| | වාර්ෂික බදු ආදායම | | | එළදා බදු ආදායම | | | දීර්ඝකාලීන බදු ආදායම | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | ඉලක්කය (රු.) | ප්‍රගතිය (රු.) | ප්‍රතිශතය | ඉලක්කය (රු.) | ප්‍රගතිය (රු.) | ප්‍රතිශතය | ඉලක්කය (රු.) | ප්‍රගතිය (රු.) | ප්‍රතිශතය |
| **2021** | 18,300,804.04 | 33,187,533.28 | 181% | 1,173,463.70 | 1,490,117.00 | 127% | 48,055,085.28 | 41,478,730.70 | 86% |
| **2022** | 25,323,044.94 | 17,823,604.43 | 70% | 1,826,432.40 | 1,652,826.75 | 90% | 74,311,683.19 | 84,758,481.03 | 114% |
| **2023** | 20,794,431.50 | 21,159,073.77 | 102% | 2,133,696.00 | 2,299,936.55 | 108% | 68,970,985.15 | 57,175,137.03 | 83% |
| **2024** | 27,239,355.05 | 27,870,940.36 | 102% | 2,533,539.00 | 2,572,295.40 | 102% | 57,796,490.52 | 62,970,457.88 | 109% |

**2024 ගැනුම් මිල ආදායම**
**දකුණු පළාත**
**රු.මි. 43.5**

**2024 වෙන්දේසි හා වෙනත් ආදායම**
**දකුණු පළාත**
**රු.මි. 9.2**

**2024 හිඟ බදු ආදායම**
**දකුණු පළාත**
**රු.මි. 35.6**

ඉඩම් සංවර්ධන අංශය පනත යටතේ ගැනුම් මිල හා මධ්‍යම පාන්තික ආදායම් රැස් කිරීම කරනු ලබන අතර ඒවා ආදායම් ශීර්ෂ 2002-01-05 යටතේ ගිණුම්ගත කරනු ලබයි.










| | ගැනුම් මිල ආදායම | | | වෙන්දේසි බදු හා වෙනත් බදු ආදායම | | | හිඟ බදු ආදායම | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | ඉලක්කය (රු.) | ප්‍රගතිය (රු.) | ප්‍රතිශතය | ඉලක්කය (රු.) | ප්‍රගතිය (රු.) | ප්‍රතිශතය | ඉලක්කය (රු.) | ප්‍රගතිය (රු.) | ප්‍රතිශතය |
| **2021** | 15,232,954.50 | 37,124,275.92 | 244% | 1,998,324.00 | 7,868,806.10 | 394% | 67,665,641.18 | 20,312,873.00 | 30% |
| **2022** | 24,071,367.86 | 45,043,991.92 | 187% | 3,717,171.00 | 16,485,566.35 | 443% | 66,332,165.84 | 37,262,486.57 | 56% |
| **2023** | 29,248,000.39 | 39,058,172.43 | 134% | 11,579,684.00 | 46,225,051.40 | 399% | 54,336,178.77 | 29,808,067.62 | 55% |
| **2024** | 34,077,092.35 | 43,588,926.48 | 128% | 7,776,986.00 | 9,252,349.44 | 119% | 45,790,596.75 | 35,608,870.87 | 78% |

# හිඟබදු අයකිරීම 2024 සහ 2025

දකුණු පළාතේ රජයේ ඉඩම්වල ආදායම් එක්රැස් කිරීමේදී දීර්ඝකාලයක් මුළුල්ලේ විවිධ කරුණු හේතුවෙන් විශාල හිඟ බදු මුදලක් එකතු වී ඇති අතර එම හිඟ බදු මුදල නිසි ලෙස වාර්තාගත නොවීමේ ගැටළුවක් නිරීක්ෂණය විය.

| 2024 වර්ෂය | ගාල්ල | | | මාතර | | | හම්බන්තොට | | | දකුණු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය (රු.) | ප්‍රගතිය (රු.) | % | ඉලක්කය (රු.) | ප්‍රගතිය (රු.) | % | ඉලක්කය (රු.) | ප්‍රගතිය (රු.) | % | ඉලක්කය (රු.) | ප්‍රගතිය (රු.) | % |
| හිඟ දීර්ඝ කාලීන බදු මුදල් | 12,049,639.62 | 10,326,694.62 | 86% | 4,370,027.30 | 4,451,618.61 | 102% | 8,649,762.00 | 7,736,774.00 | 89% | 25,069,428.92 | 22,515,087.23 | 90% |
| හිඟ වාර්ෂික හා එළදා බදු මුදල් | 3,706,108.00 | 3,198,873.75 | 86% | 478,608.48 | 616,929.10 | 129% | 281,775.00 | 322,080.00 | 114% | 4,466,491.48 | 4,137,882.85 | 93% |
| හිඟ ගැනුම් මිල | 9,265,303.40 | 4,819,656.20 | 52% | 5,026,772.26 | 2,798,558.59 | 56% | 1,962,600.00 | 1,337,685.00 | 68% | 16,254,675.66 | 8,955,900.79 | 55% |
| පෙර වර්ෂවලට අදාළ මුළු හිඟ බදු | 25,021,051.02 | 18,345,224.57 | 73% | 9,875,408.04 | 7,867,106.30 | 80% | 10,894,137.00 | 9,396,540.00 | 86% | 45,790,596.06 | 35,608,870.87 | 78% |

ගණනයේදී සිදුව ඇති දෝෂ සහ අදාළ ඉඩම් ක්ෂේත්‍රයේදී තහවුරු නොවීම වැනි කරුණු මත හිඟව පැවති බදු මුදල් කපා හැරීම් හරහා දිගින් දිගටම ගණනය කරන ලද හිඟ බදු විශාල ප්‍රමාණයක් පොත්වලින් ඉවත් කර ගැනීමට හැකිවිය. ඒ අනුව සියලු හිඟ බදු මුදලින් එකතු කර අවසන් කිරීමට නොහැකි අතර හිඟ බදු අවම කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග මගින් ඉටුකළ යුතු බව තහවුරු කර ගන්නා ලදී.

1. විශාල හිඟ බදු පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බලප්‍රදේශවල සියලුම හිඟබදු ලේඛන සකස්කොට වැඩිම හිඟ බදු පවතින ග්‍රාම නිලධාරී වසම් 10 හඳුනා ගැනීම පළමුව කළ යුතු ය. එම ග්‍රාම නිලධාරී වසම් 10 හි ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා නිලධාරීන් යොමු කිරීමෙන් අදාළ බදුකරුවන් හා ඉඩම් පිළිබඳ පෞද්ගලිකව පරීක්ෂා කිරීමක් කළ යුතු ය. එහිදී ඇතැම් බදුකරුවන් ක්ෂේත්‍රයේ සිටී ද නොසිටී ද යන කාරණයත් ලේඛනයේ සඳහන් ඉඩම් ක්ෂේත්‍රයේ පවතිනවාද යන කාරණයත් පරීක්ෂා කිරීම ග්‍රාම නිලධාරීන් මගින් ලබා ගන්නා තහවුරුව තුළින් එම බදුකරුවන් සහ බදු ප්‍රමාණයන් බදු ලේඛනයෙන් විධිමත්ව ඉවත්කර ගැනීමට කටයුතු කිරීමෙන් හිඟබදු සැලකිය යුතු ප්‍රමාණයක් අඩුකර ගැනීමට හැකියාව ලැබේ.

2. ඇතැම් ඉඩම් බදු ලේඛනයේ සඳහන් නොවන වෙනත් පාර්ශවයක් විසින් භුක්ති විඳින බවට තහවුරුවීමෙන් නව වාර්ෂික බදු බලපත්‍ර සකස් කර නව තක්සේරුවක් යටතේ නව බදු ප්‍රමාණයන් ඔවුන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීම.

3. ඇතැම් භුක්ති විඳින්නන්ගේ ආදායම් අඩු වී තිබීම වැනි කරුණු මත තක්සේරු කිරීමේ දී සහනශීලි බදු මුදල් තීරණය කිරීමෙන් නොගෙවන බදු මුදල් ගෙවන තත්ත්වයට පත් කිරීමට හැකියාව ලැබීම.

4. එසේම මෙවන් බදු ලේඛන වල දැක්වෙන දීර්ඝකාලීන බදු (ඉඩම් කච්චේරි මත) ලබා දුන් සහ ගැනුම් මිල ඉඩම් සම්බන්ධයෙන් වාරික අය කර ගැනීමේදී 2022/02 චක්‍ර ලේඛනය අනුව සහන ලබා දීම මගින් වාරික අය කර ගැනීම කාර්යක්ෂම කර ගත හැකි වීම.

5. ඇතැම් අවස්ථාවල ඉතා දරිද්‍රතාවයෙන් යුතු පුද්ගලයන් භුක්ති විඳින ඉඩම් සඳහා ගැනුම් මිල ඉඩම් හා වාර්ෂික බලපත්‍ර ඉඩම් සඳහා සුවිශේෂී කරුණු මත ලැබෙන නිර්දේශ පදනම් කරගෙන ඉඩම් සංවර්ධන ආඥා පනතේ 130 වගන්තිය යටතේ පළාත් ආණ්ඩුකාරතුමා මගින් බදු මුදල් මුළුමනින්ම කපා හැරීම හෝ කොටසක් කපා හරිමින් සහන ලබාදීමෙන් ද හිගබදු ප්‍රමාණය අවම කර ගැනීමට හැකියාව ලැබේ.

6. මේ සියලු ක්‍රියාමාර්ග ගෙන බදු හා වාරික අය නොවන්නේ නම් එවැනි ඉඩම් සම්බන්ධයෙන් අදාළ බැහැර කිරීමේ ලේඛන නීත්‍යානුකූලව අවලංගු කිරීමටත් ඉන් අනතුරුව රජයේ ඉඩම් වන සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ ප්‍රතිපාදන මත ඉඩම් වල අයිතිය රජය වෙත ලබා ගැනීමට සහ ක්‍රියා කිරීම සඳහා පැහැදිලි උපදෙස් පරිදි ප්‍රාදේශීය ලේකම්වරු වෙත ලබාදීමටත් හැකියාව ලැබේ.

පවත්නා විශාල බදු ප්‍රමාණය මත අදාළ රාජකාරී ඉටු කිරීම ඉතා සංකීර්ණ හා වෙහෙසකර වන අතර විශාල වශයෙන් හිගබදු පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වෙත විශේෂ වැඩසටහන් හරහා හිගබදු අඩු කිරීමේ කටයුතු මෙම වසරේ දී ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

| 2025 වර්ෂය | ගාල්ල | මාතර | හම්බන්තොට | දකුණු පළාත |
|---|---|---|---|---|
| හිග වාර්ෂික හා එලදා බදු මුදල් (රු.) | 4,197,323.00 | 402,518.90 | 1,836,008.00 | 6,462,849.90 |
| හිග දීර්ඝ කාලීන බදු මුදල් (රු.) | 15,290,305.00 | 7,969,800.06 | 43,534,161.00 | 66,794,266.06 |
| හිග ගැනුම් මිල (රු.) | 38,625,676.88 | 5,392,864.07 | 1,991,269.00 | 46,009,809.95 |
| පෙර වර්ෂවලට අදාළ මුළු හිග බදු (රු.) | 58,113,304.88 | 13,765,183.03 | 47,388,438.00 | 119,266,9251.91 |

# දකුණු පළාතේ ඉඩම් බැහැර කිරීම.

දකුණු පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ සිදු කරන ලද ඉඩම් රාජකාරීවලට අදාළ තොරතුරු පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත නිවැරදි කිරීමක් අපගේ 2023 පත්තිරුව ප්‍රකාශයෙන් සිදු කරන ලදී. ඒ අනුව 2024 වර්ෂය අවසාන වන විට ඉඩම් බැහැර කිරීමේ ලේඛනවලට අදාළව තොරතුරු සම්මතකරණ වැඩමුළු 3 ක් (Validation Workshops) 2025 වර්ෂයේ මුල් කාර්තුවේ දී පවත්වන ලදී.

එහිදී සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම පවතින ඉඩම් සම්බන්ධ ලේඛන (ඉ.සං.ආ. පනත යටතේ බලපත්‍ර/ලෙජර දීමනාපත්‍ර, ර.ඉ.ආ. පනත යටතේ නිදහස් දීමනාපත්‍ර, බලපත්‍ර/ලෙජර, දීර්ඝ කාලීන බදුකර සහ වාර්ෂික බදු බලපත්‍ර සංඛ්‍යාව) ගණනය කරන ලද අතර සෑම වර්ෂයක දී ම අලුතින් සකස් කරන ලද ඉඩම් සම්බන්ධ ලේඛන හා අවලංගු කරන ලද ලේඛන විධිමත් ලෙස වාර්තාගත කිරීමට කටයුතු සම්පාදනය කරන ලදී. ඒ අනුව 2024 වර්ෂයේ අවසානයේ දී කාර්යාලවල පවතින ලේඛන සංඛ්‍යාව 2024.12.31 දිනට සත්‍ය අගය යන තීරුවේ නිරූපිතයි.

| දිස්ත්‍රික්කය | | 2023.12.31 දිනට සත්‍ය අගය | 2024.12.31දිනට සත්‍ය අගය |
|---|---|---|---|
| ගාල්ල | දීමනාපත්‍ර | 55565 | 51182 |
| | නිදහස් දීමානපත්‍ර සංඛ්‍යාව | 2177 | 3170 |
| | බලපත්‍ර | 52467 | 50989 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 335 | 404 |
| | දීර්ඝකාලීන බදුකර | 144 | 109 |
| | වාර්ෂික බදු | 5075 | 5277 |
| මාතර | දීමනාපත්‍ර | 45204 | 41246 |
| | නිදහස් දීමානපත්‍ර සංඛ්‍යාව | 603 | 1138 |
| | බලපත්‍ර | 35917 | 32456 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 186 | 246 |
| | දීර්ඝකාලීන බදුකර | 22 | 23 |
| | වාර්ෂික බදු | 7631 | 7638 |
| හම්බන්තොට | දීමනාපත්‍ර | 49567 | 47090 |
| | නිදහස් දීමානපත්‍ර සංඛ්‍යාව | 1327 | 1647 |
| | බලපත්‍ර | 39068 | 38462 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 580 | 609 |
| | දීර්ඝකාලීන බදුකර | 113 | 116 |
| | වාර්ෂික බදු | 2378 | 2240 |
| දකුණු පළාත | දීමනාපත්‍ර | 150336 | 139518 |
| | නිදහස් දීමානපත්‍ර සංඛ්‍යාව | 4107 | 5955 |
| | බලපත්‍ර | 127452 | 121907 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 1073 | 1259 |
| | දීර්ඝකාලීන බදුකර | 279 | 248 |
| | වාර්ෂික බදු | 15084 | 15155 |

# දකුණු පළාතේ ඉඩම් තොරතුරු

| රාජකාරී වර්ගය | | | ගාල්ල | | මාතර | | හම්බන්තොට | | දකුණු පළාත | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2023.12.31 දිනට තොරතුරු | 2024.12.31 දිනට තොරතුරු | 2023.12.31 දිනට තොරතුරු | 2024.12.31 දිනට තොරතුරු | 2023.12.31 දිනට තොරතුරු | 2024.12.31 දිනට තොරතුරු | 2023.12.31 දිනට තොරතුරු | 2024.12.31 දිනට තොරතුරු |
| 1. | ඉ.සං.ආ. පනත යටතේ දීමනාපත්‍ර සංඛ්‍යාව | | 55565 | 51182 | 45204 | 41246 | 49567 | 47090 | 150336 | 139518 |
| 2. | ර.ඉ.ආ.පනත යටතේ නිදහස් දීමනාපත්‍ර | උරුමය වැඩසටහන | 0 | 983 | 0 | 505 | 0 | 289 | 0 | 1777 |
| | | නේවාසික | 6 | 23 | | 7 | 11 | 31 | 17 | 61 |
| | | සුනාමි දීමනාපත්‍ර | 2150 | 2163 | 597 | 624 | 1310 | 1319 | 4057 | 4106 |
| | | රණවිරු | 0 | 0 | 2 | 2 | 6 | 8 | 8 | 10 |
| | | ආපදා | 1 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 1 |
| 3. | බලපත්‍ර සංඛ්‍යාව | | 52467 | 50989 | 35917 | 32456 | 39068 | 38462 | 127452 | 121907 |
| 4. | දීර්ඝකාලීන බදු අනුමැතිය ලැබී ඇති සංඛ්‍යාව | | 335 | 404 | 186 | 246 | 569 | 609 | 1062 | 1259 |
| 5. | දීර්ඝකාලීන බදුකරය සකස් වී ඇති ප්‍රමාණය | | 101 | 109 | 22 | 23 | 113 | 116 | 236 | 248 |
| 6. | වාර්ෂික බදු | LC 75 | 1339 | 1704 | 802 | 908 | 1608 | 1609 | 3744 | 4221 |
| | | LC 71 | 4 | 2 | 3 | 3 | 1 | 1 | 8 | 6 |
| | | LC 78 | 3732 | 3571 | 6826 | 6727 | 769 | 630 | 11327 | 10928 |
| 7. | නව අනවසර අල්ලා ගැනීම් සංඛ්‍යාව | | 56 | 19 | 8 | 11 | 95 | 42 | 159 | 72 |
| 8. | සුදුසුකම්ලාභී ලේඛනයේ සිටින අනවසරකරුවන් සංඛ්‍යාව | | | 3153 | | 5833 | | 4010 | | 12996 |
| 9. | උරුමය නිදහස් දීමනාපත්‍ර සකස් කර නැති එහෙත් රජයට භාර ගෙන ඇති දීමනාපත්‍ර සහ බලපත්‍ර සංඛ්‍යාව | | | 5605 | | 6137 | | 6748 | | 18490 |

ඉහත දිස්ත්‍රික් මට්ටමින් දක්වා ඇති තොරතුරු ප්‍රාදේශීය ලේකමම් කොට්ඨාස මට්ටමින් පහත දැක්වේ.

| ගාල්ල දිස්ත්‍රික්කය | | 2023.12.31 දිනට තොරතුරු | 2024.12.31 දිනට තොරතුරු |
|---|---|---|---|
| අක්මීමණ | දීමනාපත්‍ර සංඛ්‍යාව | 2165 | 1971 |
| | නිදහස් දීමනාපත්‍ර සංඛ්‍යාව | 331 | 398 |
| | බලපත්‍ර සංඛ්‍යාව | 5054 | 4804 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 15 | 17 |
| | දීර්ඝකාලීන බදුකර | 4 | 5 |
| | වාර්ෂික බදු | 212 | 226 |
| අම්බලන්ගොඩ | දීමනාපත්‍ර සංඛ්‍යාව | 1869 | 1639 |
| | නිදහස් දීමනාපත්‍ර සංඛ්‍යාව | 105 | 144 |
| | බලපත්‍ර සංඛ්‍යාව | 646 | 612 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 0 | 0 |
| | දීර්ඝකාලීන බදුකර | 5 | 5 |
| | වාර්ෂික බදු | 36 | 42 |
| බද්දේගම | දීමනාපත්‍ර සංඛ්‍යාව | 994 | 665 |
| | නිදහස් දීමනාපත්‍ර සංඛ්‍යාව | 0 | 17 |
| | බලපත්‍ර සංඛ්‍යාව | 523 | 430 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 9 | 12 |
| | දීර්ඝකාලීන බදුකර | 0 | 0 |
| | වාර්ෂික බදු | 84 | 86 |
| බලපිටිය | දීමනාපත්‍ර සංඛ්‍යාව | 2413 | 2219 |
| | නිදහස් දීමනාපත්‍ර සංඛ්‍යාව | 308 | 357 |
| | බලපත්‍ර සංඛ්‍යාව | 931 | 869 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 8 | 8 |
| | දීර්ඝකාලීන බදුකර | 0 | 0 |
| | වාර්ෂික බදු | 38 | 43 |
| බෙන්තොට | දීමනාපත්‍ර සංඛ්‍යාව | 2129 | 2077 |
| | නිදහස් දීමනාපත්‍ර සංඛ්‍යාව | 27 | 42 |
| | බලපත්‍ර සංඛ්‍යාව | 1420 | 1433 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 26 | 26 |
| | දීර්ඝකාලීන බදුකර | 2 | 2 |
| | වාර්ෂික බදු | 98 | 112 |

| ගාල්ල දිස්ත්‍රික්කය | | 2023.12.31 දිනට තොරතුරු | 2024.12.31 දිනට තොරතුරු |
|---|---|---|---|
| බෝපේ-පෝද්දල | දීමනාපත්‍ර සංඛ්‍යාව | 1380 | 1162 |
| | නිදහස් දීමනාපත්‍ර සංඛ්‍යාව | 1 | 33 |
| | බලපත්‍ර සංඛ්‍යාව | 393 | 363 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 14 | 18 |
| | දීර්ඝකාලීන බදුකර | 4 | 4 |
| | වාර්ෂික බදු | 43 | 65 |
| ඇල්පිටිය | දීමනාපත්‍ර සංඛ්‍යාව | 5350 | 5131 |
| | නිදහස් දීමනාපත්‍ර සංඛ්‍යාව | 0 | 113 |
| | බලපත්‍ර සංඛ්‍යාව | 5221 | 5203 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 71 | 49 |
| | දීර්ඝකාලීන බදුකර | 20 | 20 |
| | වාර්ෂික බදු | 664 | 665 |
| ගෝනුපීනුවල | දීමනාපත්‍ර සංඛ්‍යාව | 1152 | 944 |
| | නිදහස් දීමනාපත්‍ර සංඛ්‍යාව | 138 | 159 |
| | බලපත්‍ර සංඛ්‍යාව | 223 | 241 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 5 | 5 |
| | දීර්ඝකාලීන බදුකර | 0 | 2 |
| | වාර්ෂික බදු | 50 | 60 |
| හබරාදූව | දීමනාපත්‍ර සංඛ්‍යාව | 1327 | 923 |
| | නිදහස් දීමනාපත්‍ර සංඛ්‍යාව | 0 | 24 |
| | බලපත්‍ර සංඛ්‍යාව | 297 | 254 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 0 | 2 |
| | දීර්ඝකාලීන බදුකර | 15 | 11 |
| | වාර්ෂික බදු | 86 | 164 |
| හික්කඩුව | දීමනාපත්‍ර සංඛ්‍යාව | 378 | 296 |
| | නිදහස් දීමනාපත්‍ර සංඛ්‍යාව | 82 | 168 |
| | බලපත්‍ර සංඛ්‍යාව | 388 | 6 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 22 | 28 |
| | දීර්ඝකාලීන බදුකර | 1 | 1 |
| | වාර්ෂික බදු | 21 | 20 |

| ගාල්ල දිස්ත්‍රික්කය | | 2023.12.31 දිනට තොරතුරු | 2024.12.31 දිනට තොරතුරු |
|---|---|---|---|
| ඉමදූව | දීමනාපත්‍ර සංඛ්‍යාව | 2349 | 2191 |
| | නිදහස් දීමනාපත්‍ර සංඛ්‍යාව | 180 | 197 |
| | බලපත්‍ර සංඛ්‍යාව | 1826 | 1827 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 14 | 14 |
| | දීර්ඝකාලීන බදුකර | 0 | 0 |
| | වාර්ෂික බදු | 277 | 285 |
| කඩවත්සතර | දීමනාපත්‍ර සංඛ්‍යාව | 87 | 84 |
| | නිදහස් දීමනාපත්‍ර සංඛ්‍යාව | 214 | 215 |
| | බලපත්‍ර සංඛ්‍යාව | 18 | 12 |
| | දීර්ඝකාලීන බදු අනුමත | 29 | 32 |
| | දීර්ඝකාලීන බදුකර | 10 | 11 |
| | වාර්ෂික බදු | 28 | 27 |
